

# බෝග වර්ගීකරණය

ඒ.කේ.එච්.කුලරත්න
ගුරු උපදේශක (කෘෂිවිද්‍යා)
කලාප අධ්‍යාපන කාර්යාලය
හොරණ

# සවියෙන් පෙරට-අපි එකට
# e-ඉගෙනුම් පාසල
# හොරණ අධ්‍යාපන කලාපය

| | | | |
|---|---|---|---|
| 10 ශ්‍රේණිය | කෘෂි හා ආහාර තාක්ෂණය | 2 වාරය | 1 පාඩම<br><br>බෝග වර්ගීකරණය<br>(4 .නිපුණතාවය) |

ඉගෙනීමේ හෝ බෝග වගා පාලනය කිරීමේ පහසුව සඳහා විවිධ බෝග වර්ග කාණ්ඩ කර හෝ වෙන්කර දක්වීම  ලෙස හැඳින්විය හැකි යි



බෝග වර්ගීකරණය ප්‍ර [illegible] ආකාර දෙකකට සිදු කරනු ලැබේ.

- කෘෂිකාර්මික බෝග වර්ගීකරණය
- විද්‍යාත්මක බෝග වර්ගීකරණය

# කෘෂිකාර්මික බෝග වර්ගීකරණය

බෝග වගාවේ දී සිදු කරන විවිධ පාලන හා නඩත්තු කටයුතුවලට උචිත අන්දමට තෝරාගත් නිර්ණායක මත බෝග වර්ගීකරණය කිරීම කෘෂිකාර්මික බෝග වර්ගීකරණයයි

## කෘෂිකාර්මික බෝග වර්ගීකරණය

- ප්‍රයෝජන අනුව
- වැඩෙන පරිසරය අනුව
- බෝගවල වර්ධන විලාසය අනුව
- බෝගවල වයස අනුව

# ප්‍රයෝජන අනුව බෝග වර්ගීකරණය

- ආහාර සඳහා
- කාර්මික කටයුතු සඳහා
- අපනයනය සඳහා
- ඖෂධ සඳහා
- දැව සඳහා
- පාංශු ඛාදනය වැළැක්වීම සඳහා
- කොළ පොහොර සඳහා

# ආහාර සඳහා

## ධාන්‍ය බෝග

වී



කුරක්කන්



මෙනේරි



ඉදල් ඉරිඟු



බඩ ඉරිඟු




තිරිඟු



# අල බෝග

බතල



මඤ්ඤොක්කා



වැල්අල



# පලතුරු බෝග

**අඹ කෙසෙල් පැපොල් රඹුටන් මැංගුස් දූරියන් අන්නාසි ලොවි වෙරළු මිදි පේර දොඩම් කොමඩු**



# එළවළු බෝග

උඩරට එළවළු -කැරට් බීට් රූට් ලීක්ස් ගෝවා නෝකෝල් බෝංචි

පහතරට එළවළු -පතෝල වැටකොළු බන්ඩක්කා කරවිල බටු ලබු වට්ටක්කා



# මාෂ බෝග

මුං කව්පි උඳු සෝයා බෝංචි කඩල පරිප්පු



# කුළුබඩු බෝග

මිරිස්   කහ   ගම්මිරිස්   කුරුඳු   කරාබුනැටි  කරදමුංගු



# කොළ එළවළු

කංකුන් ගොටුකොළ සාරණ තම්පලා නිවිති මුකුනුවැන්න කතුරුමුරුංගා










# කාර්මික කටයුතු සඳහා

## කෙඳි බෝග

හණ, කපු, ජූට්,







# සීනි නිස්සාරක බෝග

උක් | බීට, | තල්







| | |
|---|---|
| වැවිලි බෝග | ■ පොල්, රබර්, තේ |
| ඉඩම්වල සෝදා පාළුව වැළැක්වීම සඳහා | ■ ආවරණ බෝග පියුරේරියා, ඩෙස්මෝඩියම් |
| කොළ පොහොර සඳහා | ■ කොළ පොහොර ශාක වල් සූරියකාන්ත, ග්ලිරිසීඩියා, අඩනහිරියා |
| දැව බෝග | ■ තේක්ක, හැදුන්, මැහෝගනී |
| ඖෂධ බෝග | ■ හාතාවාරිය, තෙල්ඩි, ඉඟුරු |
| කැපූ මල් | ■ ඇන්තූරියම්, ඕකිඩ්, ජර්බෙරා |
| විසිතුරු පත්‍ර ශාක | ■ මීවන, පත්‍රික ඇන්තූරියම්, ක්‍රෝටන් |
| තෙල් බෝග | ■ තල, එඬරු, සූරියකාන්ත |
| අපනයන ආර්ථික බෝග | ■ ගම්මිරිස්, කුරුඳු, පුවක් කෝපි,ගම්මිරිස් |

# වැඩෙන පරිසරය අනුව බෝග වර්ගීකරණය

| | |
|---|---|
| ගොඩබිම වැඩෙන බෝග | ■ අඹ, පොල්, බෝංචි,අල බෝග,<br>• කෙසෙල්,අන්නාසි,මිරිස්,කුරුඳු |
| ජලාශ්‍රිත ව වැඩෙන බෝග | ■ වී, කොහිල, කංකුන් |

## ශුෂ්ක පරිසරයේ වැවෙන බෝග

තල,
කුරක්කන්
බඩඉරිඟු
කොමඬු
වට්ටක්කා



## උඩරට වැවෙන බෝග



පෙයාර්ස්,
ස්ට්‍රෝබෙරි,
මල්ගෝවා
කැරට්
ලීක්ස්

## තෙත් කලාපයේ වැවෙන බෝග

රබර්,
අන්නාසි,
වැල්දෙඩම්
මැ
තේ



## පහතරට වැවෙන බෝග



බුලත්
රඹුටන්,
පොල්
පතෝල
වැටකොලු

# ශාකවල වර්ධන විලාසය අනුව බෝග වර්ගීකරණය

| බෝග වර්ගය | උදාහරණ |
|---|---|
| පැළෑටි | බණ්ඩක්කා, අන්නාසි, මිරිස් |
| පඳුරු | කෝපි, දෙළුම්, කුරුඳු |
| ගස් | පොල්, රඹුටන්, තේක්ක |

# බෝගවල ජීවන චක්‍රය සම්පූර්ණ කිරීමට ගතවන කාලය (බෝගයේ වයස) අනුව වර්ගීකරණය

## වාර්ෂික බෝග

- ජීවන චක්‍රය සම්පූර්ණ කිරීමට වසරක් හෝ වසරකට වඩා අඩු කාලයක් ගතවන බෝග
- සෝයා බෝංචි, මෑ, මිරිස්, බණ්ඩක්කා, කරවිල

## බහුවාර්ෂික බෝග

- ජීවන චක්‍රය සම්පූර්ණ කිරීමට වසරකට වඩා වැඩි කාලයක් ගතවන බෝග
- පොල්, රබර්, ගම්මිරිස්, රඹුටන්, අඹ,කෙසෙල්,අන්නාසි

# විද්‍යාත්මක බෝග වර්ගීකරණය

විද්‍යාත්මක වර්ගීකරණයේ දී පදනම් කරගනු ලබන්නේ ශාකවල උද්භිද විද්‍යාත්මක ලක්ෂණය.

පුෂ්ප,

කඳ,

පත්‍ර

මුල්

දැනට පිළිගත් විද්‍යාත්මක වර්ගීකරණය ඉදිරිපත් කරන ලද්දේ කැරෝලස් ලිනේයස් (Carolus Linnaeus) නම් ස්වීඩන් ජාතික විද්‍යාඥයා විසිනි

බෝග කුලය

Poaceae

බෝග ගණ

එක් බෝග කුලයක් යටතේ බෝග ගණ රාශියකි

උදා- *Oryza*

බෝග විශේෂ

එක් ගණයක් යටතේ බෝග විශේෂ රාශියකි

උදා - *sativa*

විද්‍යාත්මක නාමය

***Oryza sativa* L**

මෙහි අගට L. යොදා ඇත්තේ විද්‍යාත්මක වර්ගීකරණයේ මූලිකයා වූ ලිනේයස් නම් විද්‍යාඥයාට ගෞරවයක් වශයෙනි.

| ශාක කුලය | අයත් වන බෝග විශේෂ |
| --- | --- |
| පොඒසියේ (Poaceae) - තෘණ කුලය | වී, බඩඉරිඟු, ඉදල්ඉරිඟු, කුරහන්, මෙනේරි, තණ හාල් |
| ෆැබේසියේ (Fabaceae) - රනිල කුලය | මෑ, උඳු, මුං, කඩල, බෝංචි |
| කුකර්බිටේසියේ (Cucurbitaceae) | කරවිල, වැටකොළු, පතෝල, ලබු |
| සොලනේසියේ (Solanaceae) | මිරිස්, බටු, තක්කාලි, අර්තාපල් |
| මැල්වේසියේ (Malvaceae) | බණ්ඩක්කා, කපු |
| කොන්වොල්වුලේසියේ (Convolvulaceae) | කංකුන්, බතල |
| ඇරිකේසියේ (Arecaceae) | පුවක්, පොල්, කිතුල් |
| බ්‍රැසිකේසියේ (Brassicaceae) | ගෝවා, අබ, යලාදු |
| ඇමරිලිඩේසියේ(Amaryllidaceae) | ළූනු, ලීක්ස්, සුදු ළූනු |
| ඉයුෆෝබියේසියේ (Euphorbiaceae) | මඤ්ඤොක්කා, රබර්, තෙල් එඩරු |
| රූටේසියේ (Rutaceae) | දෙහි, දොඩම්, බෙලි, දිවුල් |
| අම්බලිෆරේ (Umbelliferae) | කැරට්, සූදුරු, මහදුරු, කොත්තමල්ලි |
| ඇනකාඩියේසියේ (Anacardiaceae) | අඹ, කජු |
| සින්ජිබරේසියේ (Zingiberaceae) | ඉඟුරු, කහ |

# බෝග වර්ගීකරණයේ වැදගත්කම

• **බිම් සැකසීමේ දී -**

විවිධ බෝග වර්ග අනුව බිම් සැකසීම විවිධාකාර වේ.

උදාහරණ :- අල බෝග සඳහා තරමක් වැඩි ගැඹුරට බිම් සැකසීම කළ යුතු අතර ධාන්‍ය හා රතිල බෝග සඳහා ගැඹුරට බිම් සැකසීමක් අවශ්‍ය නොවේ

• **පොහොර යෙදීමේ දී -**

එකම කුලයේ බෝග සඳහා එකම පොහොර මිශ්‍රණය යෙදීම පහසුවකි.

උදාහරණ :- කරවිල කුලයේ බෝග සඳහා එකම පොහොර මිශ්‍රණයක් යෙදිය හැකි ය

එක ම කුලයේ විශේෂ 2 ක් අතර බද්ධය සාර්ථක ය.

උදාහරණ :- බටු ශාකයට තක්කාලි ශාකයක් බද්ධ කිරීම

• එක ම විශේෂයේ ප්‍රභේද දෙකක් අතර බද්ධය වඩාත් සාර්ථක ය.

උදාහරණ :- දේශීය තක්කාලි ප්‍රභේදයකට වැඩි දියුණු කළ තක්කාලි ප්‍රභේදයක් බද්ධ කිරීම

## බද්ධ කිරීම සඳහා ශාක තෝරා ගැනීමේ දී

- ශාක බද්ධ කිරිම කරන්නේ එකම කුලයේ ශාක අතරය.එක ම විශේෂයේ ප්‍රභේද දෙකක් අතර බද්ධය වඩාත් සාර්ථක ය.

උදා :- දේශීය තක්කාලි ප්‍රභේදයකට වැඩි දියුණු කළ තක්කාලි ප්‍රභේදයක් බද්ධ කිරීම

දෙහි, දොඩම්, නාරං එකම ශාකයකට බද්ධ කිරිම



**රසායනික වල් නාශක භාවිතයෙන්,**

රසායනික වල් නාශක භාවිතයේ දී ඒවායේ සුවිශේෂී ක්‍රියාකාරිත්වයට අමතර ව බෝගවල රූපීය ලක්ෂණ ද ප්‍රයෝජනයට ගැනේ.

උදා :- වී, උක් ආදී පොඒසියේ කුලයේ බෝග වගා කර ඇති ක්ෂේත්‍රවලට තෝරා නසන වල් නාශක යෙදීමෙන් පොඒසියේ කුලයේ බෝගය ඉතිරි වී පළල් පත්‍ර සහිත වල්පැළෑටි හා පන් වර්ග පමණක් විනාශ වේ

- පළිබෝධ පාලනයේ දී -

එකම කුලයේ බෝග එකිනෙකට ආසන්න භූමිවල හෝ එකම භූමියේ නැවත නැවත වගා කිරීමෙන් පළිබෝධ හානි වැඩි වේ.

උදා-

- සොලනේසියේ කුලයේ බෝග එකම භූමියේ නැවත වගාව නිසා හිටුමැරීමේ රෝගයට බහුල ව ගොදුරු වේ. විවිධ කුලවල බෝග වගා කිරීමෙන් පළිබෝධ
පාලනය වේ.
- සමහර අවස්ථාවල දී පළිබෝධ පාලනය සඳහා උගුල් බෝග යොදා ගැනේ

•කුකර්බිටේසියේ කුලයේ බෝග වගාවෙන් පසු රතිල හෝ කෘසිෆරේසියේ කුලයේ බෝග වගා කිරීමෙන් ඉල් මැස්සාගේ හානිය පාලනය වේ

•සොලනේසියේ කුලයේ බෝගයක් වන මිරිස් වගාවෙන් පසු කොන්වොල්වුලේසියේ කුලයේ බෝගයක් වන බතල වගා කිරීමෙන් වල් පැළ පාලනය කළ හැකි වේ

## පළිබෝධ පාලනය සඳහා උගුල් බෝග යොදා ගැනීම

එහි දී උගුල් බෝගය ලෙස යොදා ගන්නේ වගා කරන බෝගය අයිති කුලයේම වෙනත් ශාකයකි. මැල්වේසියේ කුලයේ බෝගයක් වන බණ්ඩක්කා වගාවේ රතු කපු මකුණා (*Dysdercus cingulatus*) මර්ධනය සඳහා උගුල් බෝගය ලෙස එම කුලයටම අයත් කපු කිතිස්ස බෝගය යොදා ගැනේ.



රතු කපු මකුණා (*Dysdercus cingulatus*)


ස්තූතියි